**ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව - 2013**

**--------------------------------------------**

ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතේ 9 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. කමිටුවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කමිටුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කමිටුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** මූල්‍ය ප්‍රකාශන
-----------------

**2.1** තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

**2.2.1.** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති
--------------------------------------------------------------------------

ප්‍රමිතයේ පරිච්ඡේද 2 හි 2.52 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම්කරණ ප්‍රමිතිවලින් අවසර දී ඇති විටෙක හැර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී පෞද්ගලික බැංකුවක පැවති රු.281,050 ක් වූ අවාසිදායක බැංකු ශේෂය එම බැංකුවේ තවත් ගිණුමක වූ රු.11,116,199 ක වාසිදායක බැංකු ශේෂයට හිලව්කර ශුද්ධ අගය රු. 10,835,149 ක් ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

**2.2.2** ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී ආදායම් රු. 25,137 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) විදේශ ගමන් වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී සත්කාරක රටවල් දෙකකින් ප්‍රතිපූර්ණය කර ගත යුතු එකතුව රු. 2,659,740 ක් කලින් ගෙවීම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) අවිනිශ්චිත ගිණුමේ පැවති රු. 24,294 ක ශේෂය සම්බන්ධයෙන් පරීක්ෂා කර නිවැරදි කිරීම හෝ නිරවුල් කරන තෙක් එම ශේෂය ඉදිරියට ගෙන ඒම වෙනුවට ගුවන් ගාස්තු සහ විදේශ ගමන් වියදම් යටතේ " 2012 නොසැසඳුනු ශේෂයක් " ලෙස නම් කර ආදායම් වියදම් ගිණුමට ලියා හැර තිබුණි.

**2.3** නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්
-------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 19 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් ජාතික ඔලිම්පික් කමිටුවේ ක්‍රියාකාරීත්වය හා යුතුකම් පිළිබඳ නියෝග පැනවිය යුතු වුවද කමිටුවේ ක්‍රියාකාරීත්වය හා යුතුකම් සඳහා අත්‍යාවශ්‍ය ගිණුම්කරණ කටයුතුභාවය හා නිලවරණය වැනි කටයුතුවලදී අදාළ නියෝග පනවා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 757 (2) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර ඇති බව දන්වා තිබුණද එම වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය
---------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.10,128,471 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 21,031,472 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.31,159,943 කින් පිරිහී තිබුණි. ආදායම රු. 7,796,727 කින් අඩු වී තිබීම සහ වියදම රු.23,263,915 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්
-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ඔලිම්පික් ක්‍රියාකාරකම් සඳහා සත්කාරක රටවල් වලින් ගුවන් ටිකට් පත් වියදම් ඇතුළුව විදේශ ගමන් වියදම් සඳහා රු. 2,569,265 ක මුදලක් ලැබී තිබූ අතර ඊට අදාළ ගෙවීම් වශයෙන් රු. 3,772,482 ක මුදලක් වැයකර තිබුණි. ඒ අනුව ලද මුදලට වඩා රු. 1,203,217 ක මුදලක් කමිටුවේ අරමුදලින් ගෙවීම්කර තිබුණි.

(ආ) ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව විසින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් 5 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. 5,684,561 ක මුදලක් ලබා දී තිබූ අතර ඊට අදාළ ගෙවීම් වශයෙන් රු.8,942,637 ක මුදලක් වැයකර තිබුණි. ඒ අනුව ලද මුදලට වඩා රු.3,258,076 ක් කමිටුවේ අරමුදලින් ගෙවීම් කර තිබුණි.

(ඇ) සාමාජික සංගම් අතර බෙදා දීම සඳහා ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවෙන් ලැබී තිබූ එකතුව රු. 2,350,000 ක් වූ අරමුදල් සමාලෝචිත වර්ෂය තුළදී අදාළ සංගම්වලට ලබා දී නොතිබුණි.

4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු
---------------------------------

2013 වර්ෂය තුළ ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටුවේ 75 වන සංවත්සරයට සමගාමීව රු.5,200,000 ක මුදලකට "සමරු පොත්" 2000 ක් මුද්‍රණය කර සැපයීමේ කාර්යය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව පුද්ගලික ආයතනයක් තෝරාගෙන තිබුණු අතර ගිවිසුමකට එළඹීමකින් තොරව කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. එම කාර්යය සඳහා 2013 සැප්තැම්බර් 30 දින කොන්ත්‍රාත්තු වටිනාකමින් සියයට 50 ක අත්තිකාරම් මුදලක් ලෙස රු.2,600,000 ක් ගෙවා තිබුණි. 2016 සැප්තැම්බර් 30 දින වන විටත් එම කාර්යය ඉටු කරගෙන නොතිබූ අතර අත්තිකාරම් මුදල වූ රු.2,600,000 ක මුදලද අදාළ කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනයන්**

**විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කමිටුවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.**

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් පැවතීම. |
| (ආ) මූල්‍ය පාලනය | (i) දිගුකාලීනව ආයෝජනය කළ හැකි අතිරික්ත මුදල් කෙටිකාලීනව ආයෝජනය කර තිබීම. |
| | (ii) සැපයුම් සඳහා අත්තිකාරම් ගෙවා තිබීම. |